ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/S/24/04/23

## මාධ්‍ය නිවේදනය

2022 මැයි මස 09 වන දින දිවයිනේ බොහෝ ප්‍රදේශවල දේශපාලඥයින්ගේ සහ දේශපාලනයට සම්බන්ධ පවුල්වල සාමාජිකයින්ගේ නිවාස ගිනි තැබීමක් සිදුවිය. මේ පිළිබඳව වින්දිත පාර්ශවයන් වෙතින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී ඇත. ඒ පැමිණිලි අතර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ නිවස ගිනි තැබීම පිළිබඳ පැමිණිල්ල ද විය.

ඒ අනුව එම පැමිණිල්ල පිළිබඳ කරුණු පැහැදිලි කිරීමට අමාත්‍යවරයා කොමිෂන් සභාව වෙත මීට පෙර කැඳවීමක් සිදුකළත්, පාර්ලිමේන්තු කටයුතු නිසා අමාත්‍යවරයා කරුණු පැහැදිලි කිරීමට වෙනත් දිනයක් ඉල්ලුම් කරන ලදී. ඒ අනුව අමාත්‍යවරයා 2023.04.24 වන අද දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමිය සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඉදිරියේ මෙම පැමිණිල්ල අදාළව කරුණු පැහැදිලි කිරිමක් කරන ලදි. එම ගිනිතැබීමට අදාලව ලියකියවිලි ද භාරදෙන ලදී. උක්ත පැමිණිල්ල පිළිබඳ ඉදිරි විමර්ශන තවදුරටත් සිදුකරන අතර, මෙම පැමිණිලි සම්බන්ධයෙන් මී ලග පරීක්ෂණ දිනයේදි ත්‍රිවිධ හමුදාව වෙතින් ප්‍රකාශ ලබාගැනීමට මේ වනවිටත් තීරණය කර ඇත.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.04.24